කෙනෙක්ට කරදරයක් කරන්නවත්, පළිගන්නවත් බෑ. එහෙම කරන්න නම් ඒ හිතේ තියෙන්න ඕනෙ තරහවයි, වෛරයයි, ක්‍රෝධයයි. අනාදිමත් කාලෙක ඉඳලා අදටත් එම නගරෙ කාලෙන් කාලෙට විනාශ වෙන්නේ කණ්ණගීගේ හිතේ ඇතිවුන අසීමිත වෛරය නිසා. ඒ වගේ වෛරී චෛතසිකයකින් මිය පරලොව ගිය කෙනෙක්ට මහා බලැති දේවත්වයක් ආරෝපණය කරන්නේ ජන විඥානයෙන් පැණ නගින සුසන්ධීකරණ සංකල්පයේ බලපෑම නිසා කියන එක අපට දැන් තේරුම් ගන්න පුලුවන්.

## ගණේෂ් හෙවත් ගණපති දෙවිඳු

ගණදෙවි ඇදහීම බොහෝ කාලෙක ඉඳන්ම සිංහල ජන සමාජයේ දකින්න ලැබුනත්, මේ විශ්වාසය උදක්ම හින්දු ආගම හරහා සිංහල සමාජයට ආ එකක් බව පැහැදිලිවම පේන කාරණයක් . ගණපති, කතරගම දෙවියන්ගේ සහෝදරයෙක් කියලත් ජනශ්‍රැතියක් තියෙනවා. කඳ කුමාරයගේ හිත ගිය කුමරිය වුනේ වල්ලි අම්මා. ඒත් කඳ කුමාරයා ගැන වල්ලිගේ හිතේ ඒ වගේ විශේෂ කැමැත්තක් තිබුනේ නෑ. මේ තරුණියගේ හිත ගන්න උපායක් කල්පනා කරපු සහෝදරයෝ දෙන්නා මේ වගේ අදහසක් ක්‍රියාත්මක කළා.

තාවකාලිකව වෙස් මාරු කර ගන්න පුලුවන් ගුප්ත බලයක් තියෙන ගණේෂ්, තමන්ගේ සහෝදරයාට උදවු කරන්න හිතාගෙන ඇත් වේෂයක් මවා ගත්තා. ඇත්තු ගැන වල්ලි අම්මාගේ තියෙන අසීමිත බය මේ අය උපායශීලීව ප්‍රයෝජනයට ගත්තා. වල්ලි අම්මා දියට යද්දී ඇත් වේෂයක් මවා ගත්ත ගණේෂ් ඒ පැත්තට දුවගෙන යද්දී, කඳ කුමාරයා ඒ වෙලාවේ එතන්ට ඇවිත් ඇතාව මෙල්ල කරන බව පෙන්නලා, වල්ලිව බේරා ගෙන ඈ ඉදිරියේ වීරයෙක් වෙන එක තමයි සැලසුම. හැමදේම හරියට කෙරුනත් කතා කරගත්ත විදියට මතුරපු පැන් කෙණ්ඩියෙන් ගනේෂ්ට පැන් ඉහලා ඇත් වේෂයෙන් මුදවගෙන ආයෙත් මනුෂ්‍ය වේෂය ගැනීමට කඳ කුමාරයට අමතක වුණා. වල්ලි අම්මා තමන් ළඟට ආව සතුට නිසා සැලසුමේ

***<u>කොහොම වුණත් මේ වගේ ක්‍රෝධ සහගත අදහස් තියෙන, අයහපතට; අකුසලයට වගේම පාපයට හිතෛශී චරිත පවා දේවත්වයෙන් සැලකීම සිංහල ජනශ්‍රැතියේ සුසංධීකරණයට ගෙනහැර දක්වන්න පුලුවන් සුදුසුම උදාහරණයක්.</u>***

අන්තිම කොටස කඳ කුමාරයට අමතක වුණේ ඉබේම වගේ.

කොහොම වුණත් ඇත් වේෂය ස්ථිර වෙන්න ඉතාම සුළු කාලයක් තියෙද්දී කඳ කුමාරයට සැලසුමේ අවසාන වගකීම සිහියට ආවා. දුවගෙන ඇවිත් කෙණ්ඩියේ තිබුණු මතුරපු පැන් ඉස්සත් ඒ එක්කම කාලය ඉවර වුණා. වතුර ඉහුණු ඇඟ මිනිස් වේෂයට පෙරලුණා. ඒත් වතුර ඉහුණේ නැති ඔලුව, ඇත් ස්වරූපයෙන්ම ස්ථිර වුණා.

කඳ කුමාරයට තමන්ගේ හීනේ හැබෑ කර ගන්න පුලුවන් වුනත්, උදවුවට ගිය ගණේෂ්ට සිද්ධ වුණේ එදා ඉඳලා අර්ධ මනුෂ්‍ය" අර්ධ හස්ති වේෂයෙන් ජීවත් වෙන්නයි. තමාට තමා ගැන ආරක්ෂාව සලසා ගන්න නොහැකි වුණු ඒ වගේ කෙනෙකුට දේවත්වයක් ආරෝපණය කිරීම තමයි සුසංධීකරණය යොදපු අවස්ථාව. ඒත් මේ කතාවට සුසන්ධීකරණය යොදා ගැනීමේ උච්චතම අවස්ථාව වෙන්නේ, මෙම දෙවියාට " නුවණට අධිපති" කියන ගෞරව බහුමානය පුදන එක.

## විභීෂණ දිව්‍ය රාජ

රාම - රාවණ කතාව කියන්නේ ලංකාවෙයි භාරතයෙයි විතරක් නෙවෙයි ලෝකයේ විවිධ රටවල ඉතිහාසඥයින්ගේ පවා අවධානයට පත් වුණු ඉතිහාස කතාවක්.

රාම-රාවණ යුද්ධය අවසාන භාගය වෙද්දී රාම කුමාරයා රාවණ රජතුමාට ඊතල බොහෝ ගණනකින් විද්දා. ඒවායින් රාවණගේ ඔලුව වෙන් වුවත්, ඉබේටම ආයෙත් එතනින් ඔලුවක් මැවුණා. ඒ තමයි රාවණ රජතුමාගේ තිබුණු අද්භූත බලයේ මහිමය. මේ විදියට පහර දෙන කොට ළඟ තිබුණු ඊතල ඉවර වෙන්නත් ළං වුන නිසා රාම බයට පත්වුණා. ඒත් මේ වෙලාවේදී, රාවණාව ඝාතනය කරන්න නම් එතුමාගේ හිසට නෙවෙයි, නාභියට ඊතල පහර එල්ල කළ යුතුය කියන රහසයි, එතුමාගේ බලය රැඳිලා තියෙන්නේ නාභියේය කියන රහසයි රාම කුමාරයට එළි කරලා, ජාතිය පාවා දුන්නේ රාවණාගේම සහෝදරයෙක් වුණු විභීෂණ. විභීෂණ තමන්ගේ සහෝදරයාව විතරක් නෙවෙයි හෙළ ජාතියම පර ජාතිකයෙක් ඉස්සරහ දණ ගැස්සුවා.

ඒත් සිංහල ජනශ්‍රැතියට අනුව විභීෂණ කියන්නේ පසු කාලෙකදි ලංකාව ආරක්ෂා කර ගැනීමේ වගකීම භාර ගත්ත දෙවියා. සමන්, විභීෂණ, කතරගම, බොක්සැල් කියන සිව්මහා දෙවිවරු අතරින් විභීෂණට ලංකාරක්ෂාව ගැන වගකීම පැවරුණා. එක යුගයකදි රට ජාතිය පාවලා දුන්න කෙනෙක්ගේ ඒ අධම ක්‍රියාව නොතකා හැරලා, අන්තිමේදී දේවත්වයකුත් ආරෝපණය කරලා, දේශ ආරක්ෂාවත් පවරලා දීමෙන් පේන්න් සුසන්ධීකරණ න්‍යායේ උපයුක්ත බවම නේද?

## රිට්ටා දේවි

ඕනම පංචාංග ලිතක හරි ශුභ හෝරා දැක්වෙන ලියවිල්ලක හරි අනිවාර්යෙන්ම දැක්වෙන යෝගයක් තමයි "රිට්ටා යෝගය". හැම දවසකම මේ යෝගය පිහිටන කාල පරාසය ඇතුළතදී කිසිම ශුභ කටයුත්තක් පටන් ගන්න එපාය කියලා ජ්‍යෝතිශ්‍යවේදීන් අවවාද දෙනවා. ඒ අය නැකත් හදන්නෙත් මේ කියන රිට්ටා කාල හෝරාව මඟ හැරලා. සිංහල සමාජය මේ යෝගය අශුභ කාල හෝරාවකටත් වඩා නපුරු වේලාවක් විදියට තමයි විශ්වාස කරන්නේ.

මේ හෝරාව ගැන තියෙන තවත් අපූරුම ආකල්පයක් තමයි, මේ කාලය ඇතුළතදි පටන් ගන්න නපුරු, පාපතර ක්‍රියා හැම එකක්ම සාර්ථකත්වයට පත් වෙනවා කියන එක. හොර මැරකම්, මිනී මැරීම්, මංකොල්ලකෑම් වගේ අයහපත් වැඩට රිට්ටා කාලයට වැඩිය ගැලපෙන කාලයක් තවත් නෑ කියල කියනවා. ඒ විතරක් නෙවෙයි කාන්තාවන්ට විවිධ හිරිහැර කරදර සිදුවෙනවා බලාගෙන ඉඳීමෙනුත් රිට්ටා යෝගයට අධිපති රිට්ටා දේවිය සතුටු වන බව ජනශ්‍රැතියේ සඳහන් වෙනවා. ඒ නිසාම හොරු, මංකොල්ලකාරයෝ, ස්ත්‍රී දූෂකයෝ වගේ අසත්පුරුෂයෝ තමන්ගේ අයහපත් වැඩ පටන් ගන්නේත් "රිට්ටා දෙවියන්ගේ පිහිටයි" කියලලු. මොනම ආකාරයේ අයහපත් ක්‍රියාවකට වුණත් මෙහෙම අත ගැහුවොත් වරදට අහු නොවී, දඬුවමකට ලක්නොවී බේරෙන්න පුලුවන් බව රිට්ටා දේවියගේ අනුගාමික පිරිස් විශ්වාස කරනවා.

කොහොම වුණත් මේ වගේ ක්‍රෝධ සහගත අදහස් තියෙන, අයහපතට; අකුසලයට වගේම පාපයට හිතෛශී චරිත පවා දේවත්වයෙන් සැලකීම සිංහල ජනශ්‍රැතියේ සුසංධීකරණයට ගෙනහැර දක්වන්න පුලුවන් සුදුසුම උදාහරණයක්. සමහර වෙලාවලදී වැරදි කරන අය ඒ චෝදනාවලින් ගැලවිලා යන්නේ දේව හාසකමකින් වගේ කියලා අපි කතා වෙනවා. ඒත් මනුස්සකමට ගරුකරන සත්‍යවාදී යහපත් දෙවි දේවතාවෝ ඒ වගේ අමානුෂික වංචාවන්ට පිහිට වෙන්නේ කොහොමද? මේ ගැටළුවට පිළිතුර විදියට ගැමියෝ ඉදිරිපත් කරන්නේ "පවට රුචි කරන දේවතා ආත්මත් තියෙනවාය" කියන උපකල්පනය. රිට්ටා දේවිය සම්බන්ධ ජනශ්‍රැතිය සිංහල සමාජයට එන්නට ඇත්තේ ඒ ආකාරයට වෙන්න පුලුවන්. ඒත් "දේව" කියන්නේ සමස්ත මිනිස් වර්ගයාටම සෙත සලසන, අයහපතකින් ඔවුන්ව මුදව ගන්න අදෘශ්‍යමාන බලවේග විශේෂයකට. රිට්ටා දේවිය කියන්නේ බහුතර මිනිසුන්ගේ සිතට බයක් දෙන, සමාජයට අයහපතක් කරන, පංචශීලය බිඳ දමන සුළුතරයකගේ ආරක්ෂාව තහවුරු කරන බලවේගයක්. ඒත් ඒ සුළුතරයේ දෘෂ්ටිකෝණයෙන් සලකලා, ඒ අයට යහපතක් කරන දේවතාවක් විදියට දේව ගණයට ඇතුළත් කිරීමෙන් සුසන්ධීකරණ ගුණය ඉතාම හොඳින් පැහැදිලි වෙනවා.

සුසන්ධීකරණය කියන්නේ මුළු ලෝකයේම ජනශ්‍රැතිය එක්ක බැඳුනු සංකල්පයක්. සිංහල සමාජයේ කතාබහට ලක්වෙන දේව චරිත තුළිනුත් මේ සංකල්පය දැක ගන්න පුලුවන් බව මේ ලිපියේ කරුණුවලින් අපිට පැහැදිලිව පෙනුනා. ඊට අමතරව අතීත ලංකාවේ හිටපු පාලකයෝ, රජවරු, ජන කතාවල චරිත වගේම ලංකා සමාජයට සමීප ආගමික නායක චරිතවලිනුත් සුසංධීකරණ සංකල්පය යොදාගෙන තියෙන ආකාරය අපිට ඉදිරියේදී කතා කරන්න පුලුවන්. ■

YSL
Migration Services

MIGRATION
SERVICES

We specialise in

Skilled Migration
State Sponsorship
Parent, Spouse and Student Visa

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956

0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805
Tel: 03 8794 9818 | 03 8794 9297 :Fax

yasho@yslmigration.com
www.yslmigration.com

Lead Design House

MIGRATION AGENT
REGISTERED
mara.com.au
REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF
MIGRATION INSTITUTE
— OF AUSTRALIA —